# කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ටැම්පිට විහාර කිහිපයක සිතුවම්හි වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්

**රත්නායක ආර්.එම්.එස්.කේ.[1]**

වයඹ පළාතෙහි සුවිශේෂී ඓතිහාසික දිස්ත්‍රික්කයක් වන කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ටැම්පිට විහාර විශාල ප්‍රමාණයක් විසිර පවතින අතර, එලෙස එම ස්ථාපිතව පවතින ටැම්පිට විහාර තුළ වාස්තුවිද්‍යාත්මක වටිනාකමක් පමණක් නොව කලාත්මක වටිනාකමක්ද ගැබ්ව පවතී. මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් කලාව මේ ආශ්‍රිතව දැකගැනීමට ලැබෙන වැදගත්ම සහ වටිනාම කලාත්මක අංග ලක්ෂණයකි. එවන් සුවිශේෂී කලාත්මක පරාසයක විහිදෙන ටැම්පිට විහාර පිළිබඳව වන මෙම අධ්‍යයනය සිදුකිරීමේ ප්‍රධානම අරමුණ වන්නේ එම බිතුසිතුවම්වල වර්තමාන තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කිරීමයි. මේ පිළිබඳ සිදුකරන ලද අධ්‍යයනයේදී තොරතුරු අනාවරණය කරගැනීම සඳහා ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණය යොදාගන්නා ලද අතර මෙහිදී ක්ෂේත්‍ර ගවේෂණය වැඩි වශයෙන් යොදාගන්නා ලදී. මෙහිදී අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ටැම්පිට විහාර ත්‍රිත්වයක් යොදාගත් අතර ඒ යටතේ ඓතිහාසික බිහල්පොල වෙහෙරගල ශ්‍රී පාදස්ථාන රජමහා විහාරයේ ස්ථාපිත ටැම්පිට විහාරයත්, පඬුවස්නුවර ශ්‍රී සුමනාරාම රජමහා විහාරයේ පිහිටා ඇති ටැම්පිට විහාරය සහ මාළනාව ශ්‍රී සුගතාරාම විහාරස්ථානයේ පිහිටා ඇති ටැම්පිට විහාරය යන ස්ථානයන්හි හමුවන පැරණි සිතුවම් යොදාගන්නා ලදී. පොදුවේ ගත් කළ අධ්‍යයනයට පාදක කරගත් මෙම ටැම්පිට විහාර ත්‍රිත්වයම මහනුවර යුගයට අයත් ඒවා වූ අතර, විවිධ වර්ගයේ සිතුවම් මේ ආශ්‍රිතව දක්නට ලැබිණි. බුද්ධ චරිතය හා සබැඳි විවිධ කතා පුවත් මෙන්ම ජාතක කතා ආදිය ද මේ සිතුවම්කරණය සඳහා ප්‍රධාන වශයෙන් පාදක කොටගෙන තිබේ. කෙසේ නමුදු මේ සිතුවම්වල වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී පැහැදිලිවන්නේ මෙම සිතුවම් විවිධ හායනකාරකයන්ගේ ග්‍රහණයට නතු වී ඇති බවකි. මෙහිදී ප්‍රධාන වශයෙන්ම යථෝක්ත ප්‍රදේශය ආශ්‍රිත දේශගුණය පදනම් කරගත් හායන ක්‍රියාවලිය සහ මෙන්ම මෙම සිතුවම් සහිත පරිශ්‍රය සිය වාසභූමිය කරගත් කුඩා කෘමි සතුන්ගේ ක්‍රියාකාරකම් මෙන්ම මානුෂ ක්‍රියාකාරකම් ද මෙම හායනකාරක ක්‍රියාවලිය වේගවත් කිරීමට හේතුසාධක වී තිබේ. කෙසේ නමුදු මෙම අධ්‍යයනයෙන් එළඹිය හැකි අවසන් නිගමනය වූයේ මෙම හායනකාරකවල බලපෑම නිසා මෙන්ම තවත් විවිධ හේතු සාධකයන්ගේ බලපෑම මත මෙම සිතුවම්වලට විශාල බලපෑමක් එල්ල වී ඇති බවකි. එහෙයින් මෙම සිතුවම් අනාගත පරපුර සඳහා ආරක්ෂා කිරීම මෙන්ම ඒවාගේ කලාත්මක අගය සහ වත්මන් තත්ත්වය පිළිබඳ තොරතුරු ජනගත කිරීමත් අත්‍යයන්තයෙන්ම සිදුකළ යුත්තකි.

**මුඛ්‍ය පද :** ටැම්පිට විහාර, කුරුණෑගල දිස්ත්‍රික්කය, කලාත්මක අගය, හායනකාරක

---

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
sanjeekumarirathnayakes@gmail.com